www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු
General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020

## ජෛව පද්ධති තාක්ෂණවේදය - I
## Bio Systems Technology - I

66 | S | I

පැය : 02 යි
Time: 02 hours

විභාග අංකය : .........................................

**උපදෙස්**
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- අංක 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, හා 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එය සපයාදෙන කොටු පත්‍රයේ කතිරයක් (x) යොදා දක්වන්න.

01. පහත මත්ස්‍යයන් අතරින් බිත්තර දමන මත්ස්‍යයෙකු වන්නේ,
1. ගප්පි 2. ඩිස්කස් 3. මෝලි 4. ප්ලෙටිස් 5. ස්වෝර්ඩ් ටේල්ස්

02. විසිරුම් ජල සම්පාදන පද්ධතියක ප්‍රධාන පාලක ඒකකයට අයත් නොවනුයේ
1. ජල කරාම 2. ජල මිනුම් උපාංග 3. ජල පොම්පය
4. පීඩන මාපකය 5. රික්ත නිදහස් කිරීමේ කපාට

03. දුව ශ්‍රේණිගත කිරීම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
A - අස්වනු ක්‍රමයේදී සම්පූර්ණ දුව පරිමාවෙන් දෝෂ රහිත දුව ප්‍රතිශතය තීරණය කරනු ලබයි.
B - ශ්‍රේණිගත කිරීමේ නිර්ණායක ලෙස කඳේ හැඩයේ දෝෂ, කඳේ මතුපිට දෝෂ හා කඳේ කෙළවර දෝෂ සලකා බලනු ලබයි.
ඉහත ප්‍රකාශ පිළිබඳ නිවැරදි අර්ථ දැක්වීම සහිත වරණය තෝරන්න.
1. A සත්‍ය වන අතර B අසත්‍යයයි
2. A අසත්‍ය වන අතර B සත්‍යයයි.
3. A හා B සත්‍ය වන අතර B මඟින් A තවදුරටත් විස්තර කරනු ලබයි.
4. A හා B සත්‍ය වන නමුත් B මඟින් A තවදුරටත් විස්තර කරනු නොලබයි.
5. A හා B සත්‍ය වන නමුත් A මඟින් B විස්තර කර පැහැදිලි කරනු ලබයි.

04. මෙම ග්‍රිඩ් සටහනෙහි කුඩා කොටුවක දිග 2m ක් නම් එහි දැක්වෙන ඉඩමෙහි දළ වර්ගඵලය වනුයේ



1. $10m^2$
2. $20m^2$
3. $30m^2$
4. $40m^2$
5. $50m^2$

Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

තේ කොළ නිෂ්පාදන ක්‍රියාවලියක ගැලීම් සටහන් දෙකක් ආශ්‍රිත ප්‍රකාශන පහත දැක්වේ.

A




B




05. A හි දැක්වෙන a,b හා c ක්‍රියාවලින් පිළිවෙලින් දක්වෙනුයේ,
1. වියළීම, ඔක්සිකරණයට ලක් කිරීම, ඇඹරීම
2. ඔක්සිකරණයට ලක් කිරීම, ඇඹරීම, වියළීම
3. වියළීම, ඇඹරීම, ඔක්සිකරණයට ලක් කිරීම
4. ඇඹරීම, ඔක්සිකරණයට ලක් කිරීම, වියළීම
5. ඔක්සිකරණයට ලක් කිරීම, වියළීම හා ඇඹරීම

06. B හි දැක්වෙන ක්‍රියාවලිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය අඩංගු වරණය තෝරන්න.
1. කොළ තේ නිෂ්පාදන ක්‍රියාවලියක් නිරූපණය වේ.
2. කළු තේ නිෂ්පාදන ක්‍රියාවලියක් නිරූපණය වේ.
3. A හි දැක්වෙන a,b,c, ක්‍රියාවලින්ම B හි a,b,c මගින් නිරූපණය වේ.
4. A හි හා B හි a සම නිරූපණය වුව ද b හා c ක්‍රියාවලින් විවිධ වේ.
5. A හි c මගින් නියෝජනය වන පියවර B හි c හා d මගින් නිරූපණය වේ.

07. කොලිෆෝම් බැක්ටීරියාව ජීවත් නොවන ස්ථානයක් වනුයේ,
1. පස තුළ
2. ශාක තුළ
3. පිරිසිදු ජලයේ
4. අචලතාපීන්ගේ අන්ත්‍රයේ
5. දූෂිත ජලයේ

08. ජල සක්‍රියතාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A ආහාරයක ජල සක්‍රීයතා අගය වැඩිවන විට ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය වැඩි වේ.
B ජලය කොටසක් ආහාරයක පෝෂක කොටස් සමඟ තදින් බැඳී පවතින අතර ඉතිරිය ලිහිල්ව බැඳී පවතී.
C ආහාරයේ අඩංගු සියලුම ජලය, ජල සක්‍රීයතාව කෙරෙහි බලපායි.
මින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වනුයේ,
1. A හා B සත්‍ය වන අතර C අසත්‍ය වේ.
2. A හා C සත්‍ය වන අතර B අසත්‍ය වේ.
3. B හා C අසත්‍ය වන අතර A අසත්‍ය වේ.
4. A,B,C සියල්ල සත්‍ය වේ.
5. A,B,C සියල්ල අසත්‍ය වේ.

09. වී නිෂ්පාදනයේ, පසු අස්වනු ක්‍රියාකාරකම් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
A - කොළ මැඩීමේදී වී වල තෙතමන ප්‍රතිශතය 18 - 20% අතර පවත්වා ගත යුතුයි.
B - ගොයම් අධික ලෙස වියළීම, පිරුණු ඇට සහිත සහල් අස්වැන්නේ ප්‍රතිශතය අඩු කරයි.
ඉහත සඳහන් ප්‍රකාශය පිළිබඳ සත්‍ය නිගමනය අඩංගු වරණය තෝරන්න.
1. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
2. B අසත්‍ය වන අතර A සත්‍ය වේ.
3. A හා B සත්‍ය වන අතර B මගින් A තහවුරු කරනු නොලැබේ.
4. A හා B සත්‍ය වන අතර B මගින් A තහවුරු කරනු ලැබේ.
5. A හා B සත්‍ය වන අතර A මගින් B තහවුරු කරනු ලැබේ.

10. සිතියමක භාවිතා වන සංකේත හා පරිමාණ පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වනුයේ.
1. සංකේතවල හැඩය හා විශාලත්වය සිතියමේ පරිමාණයට අනුව වෙනස් වේ.
2. සිතියමක භාවිත වන ප්‍රධාන සංකේත වර්ග තුනකි.
3. විශාල පරිමාණයේ සිතියමක් මත සාමාන්‍යයෙන් නගරයක් නිරූපණය කරනුයේ ලක්ෂ්‍යාමය සංකේතයකිනි.
4. සිතියම අඳින කඩදාසියේ ප්‍රමාණය අනුව ද සිතියමේ පරිමාණය තීරණය වේ.
5. දත්තවල නිරවද්‍යතාව අනුව ද පරිමාණය වෙනස් කළ හැක.



agaram.lk
Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!

11. පහත ද්විරෝද ට්‍රැක්ටරයේ A කොටසේ කාර්යය වනුයේ




1. ශක්තිය ගබඩා කිරීම.
2. දහන ක්‍රියාවලියට ආධාර වීම.
3. අලුතින් වාතය ලබා ගැනීම.
4. දවුණු වාතය පිට කිරීම.
5. පිස්ටනය හා දඟර කඳ සම්බන්ධ කිරීම.

12. මින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
1. කැල්සියම් සහිත හුණු ගල් මත වර්ධනය වන පස සුදු පැහැයක් පෙන්වයි.
2. පෙල්ස්පාර් සහිත තෙත් කලාපීය පස - සුදු පැහැයක් ගනී.
3. මුහුදු වැලි මත නිර්මාණය වූ නොමේරූ රොගොසෝල් පස - සුදු වර්ණයක් ගනී.
4. කාබනික ද්‍රව්‍ය අධික පස කළු වර්ණයක් ගනී.
5. ජල වහනය දුර්වල පස කළු පැහැයට හුරු අළු පැහැයක් පෙන්වයි.

13. බහුරෝපිත මත්ස්‍ය වගාව පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය වනුයේ,
1. මත්ස්‍යයන් ඉතා මිල අධික වීම හා අවදානම් සහිත වීම.
2. ලෙඩ රෝග ඇතිවීමේ අවදානම බහුලවීම
3. අත්දැකීම් බහුල සේවකයන් අවශ්‍ය වීම.
4. පොකුණේ ඒකකයකින් ලැබෙන අස්වැන්න අඩු ය.
5. ප්‍රමාණයෙන් විශාල මත්ස්‍යයන් ඇති නොවීම.

14. පාලිත පරිසර තත්ත්ව ලබාදීම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශය සලකා බලන්න.

A - ඇලුම් නෙට් (Alumnet) මගින් ආලෝක තීව්‍රතාව අඩු වූ විට වැඩි කළ හැකි අතර උෂ්ණත්වය ද පාලනය කළ හැක.

B - උෂ්ණත්වය පාලනය සඳහා Exhaust fan හා සචල ලුවර් භාවිතය මගින් සිදු කළ හැක.

C - තෙතමනය පාලනය සඳහා Silica gel හා Illuminometer යොදා ගත හැක.

ඉහත ප්‍රකාශය අතුරින් **සත්‍ය** ප්‍රකාශය අඩංගු වරණය තෝරන්න.

1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. A හා B පමණි. 5. A හා C පමණි.

15. පහත ප්‍රකාශ අතුරින් **සත්‍ය** ප්‍රකාශය තෝරන්න.
1. මද සුළඟ උත්ස්වේදනය කෙරෙහි බලපෑම් ඇති කරයි.
2. වායුගෝලීය පීඩනය වැඩි වීම නිසා දැඩි වර්ෂාපතන තත්ත්ව ඇති වේ.
3. දිවා කල දිග වැඩි වීම නිසා කිකිලියන්ගේ ලිංගික පරිණතිය සඳහා ගතවන කාලය වැඩි වේ.
4. අධික වර්ෂාපතනය නිසා මෝයකට ආශ්‍රිතව මත්ස්‍ය ගහනය වැඩි වේ.
5. රාත්‍රී කාලයේ උෂ්ණත්වය වැඩි වූ විට අර්තාපල් වල ආකන්ධ වර්ධනය හොඳින් සිදු වේ.

16. කිරිවල ගුණාත්මය පරීක්ෂා කිරීමේදී සිදු කරන RESAZURIN පරීක්ෂාව මගින්,
1. කිරිවල නැවුම් බව පිළිබඳව අදහසක් ලබාගත හැක.
2. කිරි බැක්ටීරියා මගින් ආසාදනය වී ඇත්ද යන්න පිළිබඳ නිර්ණය කළ හැක.
3. කිරිවල බැක්ටීරියා ක්‍රියාකාරිත්වය නිසා වර්ධනය වන ආම්ලිකතාවය මැන ගත හැක.
4. කිරි ආසාදනය වී ඇති බැක්ටීරියා ප්‍රමාණය පිළිබඳ අදහසක් ලබා ගත හැක.
5. කිරි වල ස්වාභාවික ආම්ලිකතාවය පිළිබඳ අදහසක් ලබා ගැනීම.



Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk

17. කේන්ද්‍රාපසාරී පොම්පයක සතියකට වරක් පමණක් සිදු කළ යුතු නඩත්තු කිරීමක් වනුයේ,
    1. බෙයාරින් ස්නේහය කිරීම.
    2. කොටස් ගලවා ශුද්ධ කිරීම.
    3. මෝටරයේ අසාමාන්‍ය ශබ්ද පරීක්ෂාව
    4. ගෙවී ඇති කොටස් මාරු කිරීම.
    5. විදුලිධාරාව පරීක්ෂා කිරීම.

18. දම්වැල් මැනුම භාවිතයට ගත නොහැකි අවස්ථාව වනුයේ,
    1. දත්ත ප්‍රමාණය අඩු ඉඩමක් මැනීමට
    2. භූ විෂමතාව අඩු ඉඩම් මැනීමට
    3. ප්‍රමාණයෙන් කුඩා ඉඩම් මැනීමට
    4. විවෘත අවකාශ අඩු ඉඩම් මැනීමට
    5. විශාල පරිමාණයේ බිම් සැලසුම් ඇඳීමට අවශ්‍ය අවස්ථාවල

19. ආහාරයක තත්ත්වය සහතික කිරීමේ දී නිවැරදි පිළිවෙල සහිත වරණය තෝරන්න.
    1. GAP, GHP, GMP, HACCP, ISO 22000
    2. GHP, GAP, GMP, HACCP, ISO 22000
    3. GAP, GMP, GHP, ISO 22000, HACCP
    4. GMP, GAP, GHP, ISO 22000, HACCP
    5. GAP, GMP, GHP, HACCP, ISO 22000

20. ක්ෂුද්‍ර පාලන පද්ධති පිළිබඳ නිවැරදි ප්‍රකාශය අඩංගු වරණය තෝරන්න.
    1. ආදානය මඟින් පිළියවන, මෝටර් හා බල්බ වැනි ඔදයන භාවිත කර ප්‍රතිලාභ ලබා දීම.
    2. ප්‍රතිදානය මඟින් අදානය ආශ්‍රිත අගයන් සලකා බලා ඔදයන පාලනය කරනු ලබයි.
    3. අදානය පාලකය (Procescors) මඟිනුත් ප්‍රතිදානය සංවේදක (Sensors) මඟිනුත් පාලනය වේ.
    4. ආදානය සංවේදනය කිරීම සඳහා සංවේදකත් ඔදයන මඟින් ප්‍රතිදානය වන සත්‍ය ප්‍රතිචාරත් අතර සබඳතාව ගොඩනගනුයේ පාලකය මඟිනුත් ය.
    5. ඔදයන නොමැති විට සංවේදක මඟින් ප්‍රතිදානය සිදු වේ.

21. එළවළු හා පලතුරුවල පසු අස්වනු තාක්ෂණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය අඩංගු වරණය තෝරන්න.
    1. පූර්ව ශීතනය මඟින් නිෂ්පාදන දින හතරකට නොඅඩු කාලයකදී ගබඩා උෂ්ණත්වයට පත් කරනු ලැබේ.
    2. ශීතදාම පරිපාලනය පදනම් වී ඇත්තේ, ප්‍රවාහන ඇසුරුම් වල තත්ත්වය පවත්වාගෙන යෑමටයි.
    3. උපරිම ගබඩා තත්ත්ව ලබා ගැනීමට අවම ඇසුරුම් කිරීමක් පවත්වා ගත යුතුය.
    4. නිෂ්පාදනයේ ස්වසන සීඝ්‍රතාව පාලනය ශිතදාම පරිපාලනයේ අරමුණයි.
    5. අවම ශ්වසන වේගයක් සහිත පලතුරු ශීත දාමය තුළ පවත්වා ගැනීම වැදගත් ය.

22. ජලප්‍රභවය හා ඒවායේ භාවිත පිළිබඳව ඇති නිවැරදිම වරණය තෝරන්න.
    1. ග්‍රැෆයිට් සහිත පංශු පැතිකඩක සච්ඡරතාව වැලිමය පසක සච්ඡරතාවකට වඩා වැඩි ය.
    2. ආටීසියානු නොවන ළිං වල අධික පීඩනයකින් ජලය ගබඩා වී ඇත.
    3. ඉතා ගැඹුරු ජලධර වල ජලය අපාරගම්‍ය පාෂාණ ස්ථර දෙකක් අතර ගබඩා වී ඇත.
    4. පසේ කාන්දුවීමේ හැකියාව අඩුවන විට භූගත ජල පුනරාරෝපණය වැඩි වේ.
    5. සාමාන්‍ය ළිං වල ජලය භූගත ජල මට්ටමට සමාන වන අතර මේවා ආටීසියානු ළිං වේ.

23. ද්විරෝද ට්‍රැක්ටරයක බල සම්ප්‍රේෂණය වන අයුරු පහත සටහනෙහි දැක්වේ. එහි A,B,C,D පිළිවෙලින් දැක්වෙනුයේ.

    එන්ජිම [A] → [B] → [C] → [D] → රෝද

    1. අක්ෂ දඬු, ගියර පෙට්ටිය, ක්ලචය, වී පටි
    2. ක්ලචය, ගියර පෙට්ටිය, වී පටි, අක්ෂ දඬු
    3. ක්ලචය, වී පටි, ගියර පෙට්ටිය, අක්ෂ දඬු
    4. වී පටි, ක්ලචය, ගියර පෙට්ටිය, අක්ෂ දඬු
    5. වී පටි, ගියර පෙට්ටිය, ක්ලචය, අක්ෂ දඬු

24. පටක රෝපණයේදී පූර්වකයක් ජීවාණුහරණය පිළිබඳ පියවර පහත දැක්වේ. ඒවා නිසි පිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය වනුයේ,
    a) මාධ්‍ය තුළ පූර්වකය තැන්පත් කිරීම
    b) මැරුණු කොටස් ඉවත් කිරීම.
    c) මධ්‍යසාර මඟින් පිරිසිදු කිරීම
    d) ගලා යන ජලයෙන් පිරිසිදු කිරීම
    e) අවශ්‍ය ප්‍රමාණයට කපා ගැනීම.

    1. b,e,d,c,a
    2. e,b,d,c,a
    3. b,d,e,c,a
    4. b,d,c,e,a
    5. e,c,d,b,a



Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk

25. කාබනික ද්‍රව්‍ය, N හා P අඩු Ca අධික, අතරමැද කලාපයේ දැකිය හැකි පස් කාණ්ඩය වනුයේ,
1. රතු දුඹුරු පස 2. රතු දුඹුරු ලැටසොලික් පස 3. රතු කහ පොඩ්සොලික් පස
4. දිය සිළු පස 5. රෙගොසෝල් පස

26. Bread Board / බ්‍රෙඩ් බෝඩ් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
A - ඉලෙක්ට්‍රොනික උපාංග ඉතා පහසුවෙන් පෑස්සීම කළ හැකි උපාංගයකි.
B - බල සැපයුම සඳහා ස්ථිර සිරස් සන්නායකයක යුගලයක් පවතී.
C - බල සැපයුම තිරස් සන්නායක හරහා වුවද උපාංග සවි කිරීම සිරස් සන්නායක මතට සිදු කරනු ලැබේ.
වඩාත් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ අඩංගු වරණය වනුයේ.
1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. A හා C පමණි. 5. B හා C පමණි.

27. බිම් සකස් කිරීම පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - බෝග වගාවක් සිදු කළ භූමියක පස කැපීම හා පෙරළීම ප්‍රාථමික බිම් සැකසීමේදී සිදු කරයි.
B - ප්‍රාථමික බිම් සැකසීමේදී වල්පැළ පාලනය සිදුවේ.
1. A පමණක් නිවැරදිය
2. B පමණක් නිවැරදිය
3. A හා B නිවැරදි අතර ප්‍රකාශ අතර ගැලපීමක් නැත.
4. A හා B නිවැරදි අතර ප්‍රකාශ අතර ගැලපීමක් ඇත.
5. A හා B ප්‍රකාශ දෙකම අසත්‍යයයි.

28. කිරි දෙවීමේ යන්ත්‍රයක සිදුවිය හැකි පීඩන විචලනය වීම් ස්වයංක්‍රීයව යථා තත්ත්වයට පත් කරනු ලබන්නේ මින් කුමන කොටස මඟින් ද?
1. පසුර 2. රික්තකමානය 3. රික්තක පොම්පය 4. රික්තක නියාමකය 5. වායු නලය

29. SLS තත්ත්ව සහතිකය පිළිබඳව **සාවද්‍ය** වරණය වනුයේ,
1. ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිති සහතිකයක් වේ.
2. නිමි භාණ්ඩයේ ප්‍රමිතිය පරීක්ෂා කිරීමෙන් සහතිකය පිරිනමයි.
3. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ලබා දෙයි.
4. බෝතල් කළ පානීය ජලය සඳහා මෙය ලබා ගැනීම අනිවාර්ය වේ.
5. මෙය ලබා ගැනීමට සමස්ත වාර්ෂික ආදායමින් 0.05% ප්‍රතිශතයක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ගෙවිය යුතු ය.

30. ජෛවීය අප ජල පවිත්‍රතා ක්‍රියාවලියේදී ස්වායු බැක්ටීරියා මඟින් කාබනික ද්‍රව්‍ය වියෝජනය කර ඔවුන්ට අවශ්‍ය ශක්තිය ලබාගනුයේ කුමන පියවර තුළදී ද?
1. මූලික පිරියම් කිරීම. 2. ප්‍රාථමික පිරියම් කිරීම.
3. ද්විතීයික පිරියම් කිරීම. 4. තෘතීයික පිරියම් කිරීම. 5. විෂබීජ නාශනය

31. රොටවේටරය පිළිබඳ අසත්‍ය ප්‍රකාශය වනුයේ,
1. පස කුඩා කැබලිවලට කැඩීමට භාවිතා කරන උපකරණයකි.
2. ගොඩ බෝග වගා සඳහා යොදා ගනු නොලැබේ.
3. සිව්රෝද ට්‍රැක්ටරවල ජවගනු දණ්ඩට සම්බන්ධ කරයි.
4. ගැඹුර පාලනයට භූමි රෝදයක් ඇත.
5. ඉන්ධන බලයෙන් ක්‍රියා කරවන උපකරණ ද ඇත.

32. 830Ω හා 3200Ω යන ප්‍රතිරෝධකයන්ගේ වර්ණ කේත තීරු සංයෝජනය නිවැරදි පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,
1. දම්, කහ, දුඹුරු සහ තැඹිලි, රතු, රතු,
2. තැඹිලි, රතු, රතු, සහ අළු, තැඹිලි, දුඹුරු
3. අළු, තැඹිලි, දුඹුරු, සහ තැඹිලි, රතු, රතු
4. දුඹුරු, තැඹිලි, අළු සහ නිල්, දම්, රතු
5. අළු, දම්, රතු සහ තැඹිලි, රතු



agaram.lk
Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!

Agaram.lk - Keep your dreams alive!

Agaram.lk - Keep your dreams alive!

33. පහත සටහනෙහි $B\hat{C}D$ අන්තර්ගත කෝණයෙහි අගය වනුයේ,




1. $87^0$
2. $97^0$
3. $137^0$
4. $147^0$
5. $177^0$

34. ද්‍රවමාන පරීක්ෂණයේ දී කැල්ගන් ද්‍රාවණය වෙනුවට යොදාගත හැකි ද්‍රව්‍යයකි.
1. හයිඩ්‍රජන් පෙරොක්සයිඩ්
2. පොටෑසියම් ක්ලෝරයිඩ්
3. ඇමෝනියම් සල්ෆේට්
4. ඒමයිල් ඇල්කොහොල්
5. ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ්

35. කාර්මික අප ජලයේ දක්නට නොලැබෙන ද්‍රව්‍යයක් වන්නේ,
1. ඛනිජ තෙල්
2. ප්‍රතිජීවක
3. තාපය
4. බැර ලෝහ
5. විවිධ රසායනික ද්‍රව්‍ය

36. සිසුවෙක් බද්ධ කිරීමකදී පහත පියවර අනුගමනය කරන ලදී.
A - බද්ධ කිරීම සඳහා පිරිසිදු මුවහත් පිහියක් යොදා ගන්නා ලදී.
B - බද්ධ කිරීමට පෙර දෑත් හොඳින් සෝදා ගන්නා ලදී.
C - බද්ධ කිරීමෙන් පසු පහළ සිට ඉහළට කැපුම හොඳින් වෙලන ලදී.
D - පැළ 70% පමණ සෙවණ ස්ථානයක තැබීය.
E - අංකුර වර්ධනය වූ පසු අංකුරය දිශාවට ආනතව කැපුම යොදා ග්‍රාහකය ඉවත් කළේය.
බද්ධයේ අසාර්ථකත්වයට හේතුවිය හැකි පියවර වනුයේ,
1. A
2. C
3. D
4. D,E
5. C,D,E

37. ට්‍රැක්ටරවල භාවිතා වන ද්‍රාව පද්ධතිය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
1. සිව්රෝද ට්‍රැක්ටර්වල ඇත.
2. ද්විරෝද ට්‍රැක්ටරවල ඇත
3. උපකරණ එසවීම හා භාරයක් ඇදගෙන යාමට යොදා ගනී.
4. ලිහිසි තෙල් පොම්පයෙන් බලය උපදවා ගනී
5. ඒකාබද්ධ අස්වනු නෙළන යන්ත්‍රවල දක්නට ලැබේ.

38. උපකරණ උස ක්‍රියාවලියෙන් මට්ටම් ගැනීම සිදු කිරීමේදී ලබාගත් දත්ත කොටස් පහත දැක්වේ. එහි A හා B සඳහා පිළිතුරු වනුයේ.

| ස්ථානය | පසු දක්ම | පෙර දක්ම | උපකරණ උස | ඌනිත උස | විස්තරය |
|---|---|---|---|---|---|
| BM | 2.51m | A | | 820m | BM |
| 1 | | 1.84 | | B | |

1. 827.22m, 828.42m
2. 822.51m, 820.67m
3. 820.67m, 822.51m
4. 827.22m, 826.42m
5. 820.2m, 822.62m

39. ඉලෙක්ට්‍රොනික පරිපථවල මිනුම් ලබාගැනීම සම්බන්ධව නිවැරදි ප්‍රකාශය අඩංගු වරණය තෝරන්න.
1. සංඛ්‍යාංක මල්ටිමීටරයේදී ඍජුව පාඨාංක ලබාදෙන අතර ශෝධනය කිරීමක් අවශ්‍ය නොවේ.
2. ප්‍රතිසම මල්ටිමීටරයේදී ඍජුවම පාඨාංක ලබාදෙන අතර ශෝධනය කිරීමක් අවශ්‍ය නොවේ.
3. සරල ධාරා මැනීමේදී මල්ටිමීටරයේ ස්පර්ශක වයර්වල තුඩු මනිනු ලබන ධාරාවට සමාන්තරගතව සම්බන්ධ කළ යුතුයි.
4. උපාංග දෙපස විභව බැස්ම මැනීම ස්පර්ශක වයර්වල තුඩු ධාරාවට ශ්‍රේණිගතව සම්බන්ධ කළ යුතු යි.
5. අවම ධාරා පරාසය පිහිටුම වෙත තෝරා ගැනීමේදී ස්පර්ශක යතුර යොමු කර මල්ටි මීටරයෙන් ධාරාව මැනීම ආරම්භ කළ යුතු ය.



agaram.lk

www.agaram.lk

40. දුව පරීක්ෂණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A ජෛවීය දුව විනාශකාරකවල හානිය අවම කිරීමට රසායනික ද්‍රව්‍ය ප්‍රතිකාරකයක් යොදා ගනී.
M සින්ක් ක්ලෝරයිඩ් යනු කාබනික දුව පරිරක්ෂකයකි.
C ක්‍රියෝසෝට් වැනි පරිරක්ෂක තාරවල මිශ්‍ර කර ආලේප කරනු ලබයි.
**සත්‍ය** ප්‍රකාශය අඩංගු වරණය වනුයේ.
1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. A හා B පමණි. 5. A හා C පමණි.

♦ **41 සිට 43 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන රූප සටහන් උපයෝගී කර ගන්න.**


A


B


C


D


E

41. පිළිවෙලින් A,C,D හා E උපකරණ වනුයේ
1. ප්‍රතිරෝධකය, සෙනර් ඩයෝඩය, ධාරිත්‍රකය, ට්‍රාන්සිස්ටරය
2. විචල්‍ය ප්‍රතිරෝධකය, ඩයෝඩය, ට්‍රාන්සිස්ටරය, ධාරිත්‍රකය
3. විචල්‍ය ප්‍රතිරෝධකය, ආලෝක විමෝචක ඩයෝඩය, ධාරිත්‍රකය, ට්‍රාන්සිස්ටරය
4. අවකර පරිනාමකය, සෙනර් ඩයෝඩය, වියලි කෝෂය, ධාරිත්‍රකය
5. ධාරිත්‍රකය, සෙනර් ඩයෝඩය, වියළි කෝෂය, ට්‍රාන්සිස්ටරය

42. පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.
a වෝල්ටීයතා විචලනය පවත්වා ගැනීම.
b අඛණ්ඩ විචලනය වන විභව සැපයුමක වෝල්ටීයතාව නිශ්චිතව පවත්වා ගැනීම.
c විදුලි ආරෝපණ තාවකාලිකව ගබඩා කිරීම.
d ධාරා හා වෝල්ටීයතා පාලනය.
පහත භාවිතයක් සඳහා ගැළපෙන උපාංග නිවැරදිව දක්වා ඇත්තේ
1. B C D E 2. A B C D 3. A C D E 4. D B A C 5. D A C A

43. ඉහත රූප සටහන් හි දක්නට ලැබෙන උපාංග භාවිත කර මනිනු ලබන මිනුම් වල ඒකක අනුපිළිවෙලින් දක්නට ලැබෙන පිළිතුර වනුයේ
1. V, $\mu$F, V, mA, V 2. V, Ω, V, V, Ω 3. Ω, Ω, V, Ω, mA, 4. V, mA, $\mu$F, V, Ω 5. Ω, Ω, V, $\mu$F, V

44. ආහාර පරීක්ෂණයේදී නිෂේධන මූලධර්මය යටතේ භාවිත කරන පරිරක්ෂණ ක්‍රමයක් නොවනුයේ,
1. ජල ක්‍රියාකාරිත්වය අඩු කිරීම 2. pH අගය අඩු කිරීම
3. පරිරක්ෂක එකතු කිරීම 4. අඩු උෂ්ණත්ව භාවිතය
5. තාප ප්‍රතිකාරකය

45. කුකුලන් ඇති කිරීමේ ක්‍රමයක් වන නිදැලි ක්‍රමය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
1. රාත්‍රී කාලයේ මෙන්ම දිවා කාලයේ ද ලැගීමට පමණක් නිවාස සලසයි.
2. හෙක්ටයාර එකකට සතුන් 350 - 450 ක් පමණ ඇති කළ හැක.
3. එල්ලා තබන නිවාස හෝ තට්ටුවක් සහිත නිවාස යොදා ගනී.
4. නිවාසය තුළ එක් සතෙකුට 1000$cm^2$ ඉඩ ප්‍රමාණයක් සැපයිය යුතු ය.
5. ආහාර බඳුන් ජල බඳුන් නිවාස තුළ නොතබයි.



Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk

46. දුව නොවන වනජ නිෂ්පාදන පිළිබඳ නිවැරදි ප්‍රකාශය අඩංගු වරණය තෝරන්න.
    1. ශාකවලින් ද්‍රව්‍ය රැස්කිරීමේදී හෝ ලබාගැනීමේදී කාලගුණික බලපෑම් අවම වන පරිදි සිදු කළ යුතුයි.
    2. සෑම විටම පටකයකින් වෑස්සෙන දියරයක් ලෙස හෝ ඇඹරීම, මිරිකීම හෝ ආසවනය යන ආකාරවලින් පමණක් ලබා ගත හැක.
    3. නිස්සාරණය ස්වාභාවිකව හෝ යන්ත්‍රයක් ආධාරයෙන් සිදු කළ හැක.
    4. හුමාල ආසවනය තාප අස්ථායී ජලයේ ද්‍රාව්‍යතාව අඩු සංයෝග නිස්සාරණයට යොදා ගනී.
    5. සායම් හා පලිබෝධනාශක යනු වාණිජමය ඉහළ ඉල්ලුමක් ඇති ශාක ස්‍රාව වේ.

47. වියළි පලතුරු මත වර්ධනය වන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය වනුයේ,
    1. *Salmonella Spp*
    2. *Aspergillus f lavus*
    3. *Aspergillus echimulates*
    4. *Saccharomyces biporus*
    5. *Torulopis spp*

48. ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය අඩංගු වරණය තෝරන්න.
    1. නිරන්තර ජල ගැලීම් ඇතිවන ස්ථාන සඳහා උස් වූ පාත්ති සකස් කර අමතරව සිරස් වගා මලු තුලද වගා කළ හැක.
    2. උත්ස්වේදනය හා වාෂ්පීකරණය පාලනය කිරීම සඳහා කළු පැහැති Poly mesh මගින් පොළොව ආවරණය කළ යුතු යි.
    3. සිරස් අවකාශයේ වගා කිරීම තුළින් පාංශු රෝග ඇතිවීම අවම කරගත හැකි ය.
    4. සෙවණ දැල් මගින් කෘමීන් විකර්ෂණය කිරීමක් ද සිදු කරනු ලබයි.
    5. කෘමි ප්‍රතිරෝධී වීම සඳහා කෘමි විකර්ෂක සංයෝග Insect Proof net වල ආලේපනය කර ඇත.

49. බෘෘඩරයක $1m^2$ තුල ඇති කළ හැකි පැටවු සංඛ්‍යාව වනුයේ,
    1. 120
    2. 100
    3. 80
    4. 60
    5. 40

50. ජෛව හායනයට ලක්වන ඇසුරුම ද්‍රව්‍ය සැකසීමට ගන්නා ජෛව බහු අවයවිකයක් නොවන්නේ
    1. පොලිවයනයිල් ඇල්කොහොල්
    2. පොලිඑස්ටර්
    3. පොලිඑතිලීන්
    4. සෙලියුලෝස්
    5. කයිටීන්

Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු
General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020

ජෛව පද්ධති තාක්ෂණවේදය - II
Bio Systems Technology - II

66 S II

පැය : 03 යි
Time: 03 hours

විභාග අංකය : ......................................

## ව්‍යුහගත රචනා

01. (A) කාලගුණික දත්ත නිවැරදිව ලබා ගැනීම සඳහා කාලගුණික මධ්‍යස්ථාන ස්ථාපනය කරනු ලැබේ.

I) කාලගුණික මධ්‍යස්ථානයක් ස්ථාපනයේදී සලකා බලන කරුණු තුනක් සඳහන් කරන්න.
1.......................................................................................................
2.......................................................................................................
3....................................................................................................... (ලකුණු 3 x 3)

II) පසේ ඒකීය පරිමාවක බර පාංශු සනත්වය නම් වේ.
පාංශු සනත්ව ආකාර දෙක සඳහන් කරන්න
1.......................................................................................................
2....................................................................................................... (ලකුණු 2 x 2)

III) පාංශු සවිවරතාව සමග ඔබ ඉහත සඳහන් කළ ආකාර වෙනස් වන ආකාරය සඳහන් කරන්න.

| සනත්ව ආකාරය | සවිවරතාවය අඩු වූ විට | සවිවරතාවය වැඩි වූ විට |
|---|---|---|
| 1.................................... | 2.................................... | 3.................................... |
| 1.................................... | 2.................................... | 3.................................... |

(ලකුණු 2 x 4)

(B) ජලයේ රසායනික පරාමිතියක් වන කඨිනත්වය තාවකාලික හා ස්ථිර ලෙස ආකාර දෙකකි.

I) තාවකාලික කඨිනත්වය කෙරෙහි බලපාන රසායනික සංයෝග දෙකක් සඳහන් කරන්න.
1.......................................................................................................
2....................................................................................................... (ලකුණු 3 x 2)

II) තාවකාලික කඨිනත්වය ඉවත් කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.
1.......................................................................................................
2....................................................................................................... (ලකුණු 3)

III) කඨින ජලය භාවිතයේ අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.
1.......................................................................................................
2....................................................................................................... (ලකුණු 3 x 2)

(C) වැසි ජල සංරක්ෂණ ව්‍යුහ ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශවල බහුලව යොදා ගනී.

I) සෑම වැසි ජල සංරක්ෂණ පද්ධතියකම තිබිය යුතු මූලික කොටස් තුනක් සඳහන් කරන්න.
1.......................................................................................................
2.......................................................................................................
3....................................................................................................... (ලකුණු 3 x 3)



Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk

(D) (i) යම් බිම් කොටසක් මැනීම සඳහා විවිධ ශිල්ප ක්‍රම යොදා ගත හැකි ය. පහත දැක්වෙනුයේ බිම් මැනුම් ශිල්ප ක්‍රමයක මූල ධර්මයයි. එම ශිල්පීය ක්‍රමය හඳුනාගෙන සඳහන් කරන්න.

............................................................ (ලකුණු 3)




ii) ඉලෙක්ට්‍රොනික දුර මැනීමේ ක්‍රමයේ වාසි දෙකක් සඳහන් කරන්න.

1............................................................

2............................................................ (ලකුණු 3 x 2)

iii) මට්ටම් ගැනීමේ ක්‍රියාවලියක් සඳහා අත්‍යාවශ්‍ය උපකරණ දෙක නම් කරන්න.

1............................................................

2............................................................ (ලකුණු 3 x 2)

iv) මට්ටම් ගැනීමේදී යොදා ගන්නා පිල් ලකුණ හඳුන්වන්න.

............................................................ (ලකුණු 3 )

v) තාවකාලික පිල් ලකුණක් යොදා ගනු ලබන්නේ කුමන අවස්ථාවක ද?

............................................................ (ලකුණු 3 x 1)

E) පහත දැක්වෙනුයේ දම්වැල් මැනීමකදී ඉඩමක් ත්‍රිකෝණවලට බෙදා ගත් සටහනකි.




i) මෙම එක් එක් ත්‍රිකෝණයේ ලම්බක දුර නොදනී නම්, වර්ගඵලය සෙවීමට භාවිත කළ හැකි සූත්‍රය සඳහන් කරන්න.

............................................................ (ලකුණු 3)

ii) එම සූත්‍රය ආශ්‍රයෙන් b ත්‍රිකෝණයේ වර්ගඵලය ගණනය කරන්න.

............................................................

............................................................

............................................................

............................................................ (ලකුණු 3 x 2)



Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

02. (A) ක්ෂුද්‍ර ප්‍රචාරණය ශාක සඳහා යොදා ගන්නා අලිංගික ප්‍රචාරණ ක්‍රමයකි.

(i) ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා මව් ශාක තෝරා ගැනීමේ දී වෛරස් වලින් තොර පැළ හඳුනා ගැනීමට කළ හැකි පරීක්ෂණයක් නම් කරන්න.

............................................................(ලකුණු 2 x 1)

(ii) ක්ෂුද්‍ර ප්‍රචාරණයට රෝපණ මාධ්‍ය සකස් කර ගැනීමට යොදාගත හැකි ස්වභාවික ද්‍රව්‍යයක් නම් කරන්න.

............................................................ (ලකුණු 2 x 1)

(iii) තල ප්‍රවාහ කැබිනට්ටුව තුළ ස්ප්‍රීතු ලාම්පුව භාවිතා කිරීමේ අරමුණු සඳහන් කරන්න.

............................................................ (ලකුණු 2 x 1)

(iv) පැළ මුල් අද්දවා ගැනීමට භාවිතා කළ හැකි හෝර්මෝනයක් සඳහන් කරන්න.

............................................................ (ලකුණු 3 x 1)

(B) සුදුසු ගුණාත්මක ආහාර මත්ස්‍යයන්ට දීම මත්ස්‍යයන්ගේ ප්‍රශස්ත වර්ධනයට හේතු වේ.

(i) මත්ස්‍ය කීටයන් සඳහා දීමට සුදුසු ජීවී ආහාරයක් නම් කරන්න.

............................................................ (ලකුණු 2)

(ii) මත්ස්‍යයන්ට ජීවී ආහාර ලබාදීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

a ............................................................

b ............................................................ (ලකුණු 3 x 2)

(iii) කෘතිම මත්ස්‍ය ආහාර සැකසීමට අධික උෂ්ණත්වය භාවිතා නොකරයි. මෙයට හේතුව සඳහන් කරන්න.

............................................................ (ලකුණු 3)

(iv) කුඩා මත්ස්‍ය කීටයන්ට කෘත්‍රිම ආහාර දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් දක්වන්න.

............................................................

............................................................ (ලකුණු 3)

(C) කෘතිම ක්‍රමයට බිත්තර රක්කවීම සඳහා බිත්තර රක්කවන යොදා ගනු ලැබේ.

I) බිත්තර රක්කවනයක් තුළ පාලනය කළ යුතු තත්ත්ව දෙකක් සඳහන් කරන්න.

1............................................................

2............................................................ (ලකුණු 1 x 2)

ii) රක්කවීම සඳහා බිත්තර තේරීමේදී සැලකිලිමත්විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

1............................................................

2............................................................ (ලකුණු 1 x 2)

iii) රක්කවීම සඳහා බිත්තර තැන්පත් කිරීමේදී පහත සඳහන් කුමන ආකාරය අනුගමනය කරනු ලැබේ ද?

1............................................................ (ලකුණු 1 x 2)



A B C

iv) ඉහත ඔබගේ පිළිතුරට හේතු සඳහන් කරන්න.

1............................................................ (ලකුණු 3)

v) දිනක් වයසැති ගුණාත්මක කුකුළු පැටවුන් තෝරා ගැනීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

1............................................................

2............................................................ (ලකුණු 3 x 2)

(D) ආහාර සකස් කිරීමේදී අධික ලෙස සකස් කිරීමෙන් පෝෂණ හානි මෙන් ම විවිධ ආකලන ද්‍රව්‍ය එකතු වීම සිදුවේ.

i) ආහාර අවම සැකසීම හඳුන්වන්න.

............................................................

............................................................ (ලකුණු 3)



agaram.lk

Agaram.lk - Keep your dreams alive!

Agaram.lk - Keep your dreams alive!

www.agaram.lk

ii) අවම සැකසීම සිදු කරන ආකාර සඳහා නිදසුන් දෙකක් සඳහන් කරන්න.
1.......................................................................................................................................
2....................................................................................................................................... (ලකුණු 1 x 2)

E. ආහාර සැකසීමේ නව ප්‍රවණතාවක් ලෙස ආහාර අධිපීඩන සැකසීමේ තාක්ෂණය භාවිතා කරනු ලැබේ.
i) මෙම තාක්ෂණයේදී භාවිත කරන පීඩනය හා කාලය සඳහන් කරන්න.
පීඩනය ......................................................................................................
කාලය ........................................................................................................ (ලකුණු 3 x 2)

ii) මෙම තාක්ෂණය මගින් ආහාර පරිරක්ෂණය කරන ආකාර දෙකක් සඳහන් කරන්න.
1. .......................................................................................................................................
2. ....................................................................................................................................... (ලකුණු 3 x 2)

iii) මෙම ක්‍රමය හඳුන්වන වෙනත් නමක් සඳහන් කරන්න.
....................................................................................................................................... (ලකුණු 3)

iv) ආහාර විෂවීම හා ආසාත්මිකතාව අතර වෙනස්කමක් සඳහන් කරන්න.

| විෂවීම | ආසාත්මිකතාව |
| --- | --- |
| ............................................... | ........................................................................................ |

(ලකුණු 3 x 2)

v) බහුල ලෙස ආහාර ආසාත්මිකතා ඇති කරවන ආහාරයක් සඳහන් කරන්න.
....................................................................................................................................... (ලකුණු 1)

vi) ආසාත්මිකතා ඇති කරවන ආහාරවල අඩංගු රසායනික සාධකයක් සඳහන් කරන්න. (ලකුණු 2)

| ආහාරය | රසායනික සාධකය |
| --- | --- |
| ............................................... | ........................................................................................ |

(ලකුණු 3 x 2)

03. (A) මිනිසාගේ පංචේන්ද්‍රියයන්ගේ උපකාරීත්වයෙන් මත්ස්‍යයකුගේ දේහය බාහිර කොටස් නිරීක්ෂණයෙන් මත්ස්‍ය අස්වනු වල ගුණාත්මකභාවය තීරණය කළ හැක. පහත දැක්වෙන රූප සටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i) ඉහත A, B හා C යන කොටස් නම් කරන්න.
A ......................................... B ......................................... C ......................................... (ලකුණු 1 x 3)

ii) ගුණාත්මය අනුව A,B හා C කොටස්වල ලක්ෂණ වගුගත කරන්න.

| ශරීර කොටස | ගුණාත්මකව ඉහළ | ගුණාත්මකව පහළ |
| --- | --- | --- |
| A | 1 | 4 |
| B | 2 | 5 |
| C | 3 | 6 |

(ලකුණු 3 x 6)

(B) i) ආරක්ෂිත ගෘහයක් තුළ භාවිත කළ හැකි පරිසර සාධක මැනීමට භාවිත කරන උපකරණ තුනක් සඳහන් කරන්න.
1.......................................................................................................................................
2.......................................................................................................................................
3....................................................................................................................................... (ලකුණු 3 x 3)

Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!


agaram.lk

www.agaram.lk

Agaram.lk - Keep your dreams alive!

ii) ඉහත සඳහන් එක් පරිසර සාධකයක් යාමනය කළ හැකි තාක්ෂණික උපක්‍රම දෙකක් සඳහන් කරන්න

1............................................................................................................

2............................................................................................................ (ලකුණු 3 x 2)

iii) ආරක්ෂිත ගෘහයක සෙවිලි ද්‍රව්‍ය ලෙස භාවිත කළ හැකි ද්‍රව්‍යයන් තුනක් සඳහන් කරන්න.

1............................................................................................................

2............................................................................................................

3............................................................................................................ (ලකුණු 3 x 3)

iv) සංසරණය වන නිර්පාංශු පද්ධතියක (NFT) කාලයට අනුව පෝෂක සංසරණය වීම ක්‍රියාත්මක වීම සඳහා භාවිත කළ හැකි උපකරණය සඳහන් කරන්න.

............................................................................................................ (ලකුණු 3)

(C) සිව්රෝද ට්‍රැක්ටරයක් පද්ධති රැසකින් සමන්විත ය.

i) පහත දැක්වෙන පද්ධතිය හඳුනාගෙන සඳහන් කරන්න.

............................................................................................................ (ලකුණු 2)




ii) මෙම පද්ධතිය භාවිත කිරීමේ අවශ්‍යතාව සඳහන් කරන්න.

............................................................................................................ (ලකුණු 3)

iii) ඉහත පද්ධතිය සඳහා වායුශෝධක භාවිතා කිරීමේ අරමුණ සඳහන් කරන්න.

............................................................................................................ (ලකුණු 3 x 1)

iv) එන්ජිමක සිසිලන පද්ධතියක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව සඳහන් කරන්න.

............................................................................................................ (ලකුණු 3)

